විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions
පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක -11/2019

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2019.12.03

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**දුබලතා විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමික නිලධාරීන්, වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කල යුතු දිනට යොමු නොකිරීම හේතුවෙන් අත්හිටුවා ඇති දූබලතා විශ්‍රාම වැටුප් නැවත සක්‍රීය කිරීම.**

1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයෙහි 19 හා 28 යන නියෝගයත්, 1981 නාවික/ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයන්හි 16 හා 25යන නියෝගයන් වලත් දක්වා ඇති පරිදි, හමුදා සේවයේ යෙදී සිටියදී හමුදා මෙහෙයුම් වලදී හෝ රාජකාරියේ නියුතුව සිටියදී රෝගී තත්වයට පත් වීමෙන් හෝ අනතුරකට භාජනය වීමෙන් දුබලතාවයට පත්වන හමුදා සාමාජිකයින් හමුදා වෛද්‍ය මණ්ඩලයක් මඟින් සේවයට නුසුදුසු බව තීරණය කර යුද්ධ/ නාවික/ ගුවන් හමුදාධිපතිවරුන් විසින් නිර්දේශ කර ඇත්නම් ඔහුට දුබලතා විශ්‍රාම වැටුපක් හිමිගන්වනු ලැබේ. මෙම දුබලතා විශ්‍රාම වැටුප නිලධාරියාට හිමි සේවා විශ්‍රාම වැටුපට අමතරව ගෙවනු ලැබේ.

02. වෛද්‍ය මණ්ඩලයක් මඟින් නිලධාරියාගේ ඉපයීමේ ශක්තිය හීනවන ප්‍රමාණය අනුව ප්‍රතිශතය තක්සේරු කරන අතර එම වෛද්‍ය වාර්තාවේ නැවත වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කල යුතු කාලයද දක්වා ඇත. බොහෝ අවස්ථා වන්හිදී විශ්‍රාමික නිලධාරියා නැවත වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කල යුතු දිනයේදී යොමු නොකිරීම හේතුවෙන් විවිධ ගැටළු පැන නැගී ඇත.

03. වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති කාල සීමාව තුල වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සිදු නොකර දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර, වසර කිහිපයකට පසුව වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීමෙන් වෛද්‍ය වාර්තාවේ දුබලතා ප්‍රතිශතය වෙනස් වන අවස්ථා හඳුනා ගත හැකිය.

04. නිසි අවස්ථාවේදී වෛද්‍ය මණ්ඩලය වෙත යොමු නොකිරීම හේතුවෙන් දුබලතා විශ්‍රාම වැටුප් අත්හිටුවීම තුල විශ්‍රාමිකයා අපහසුතාවයට ලක් වන අතර එකී කාල සීමාව තුලදී දුබලතාවය පහව ගියා සේ සැලකීමේ හැකියාවක් නොමැත. මෙවන් තත්වයන් යටතේ දුබලතා විශ්‍රාම වැටුප අත්හිටුවා ඇති විට ඉදිරියේදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

I. ස්ථිර නොවන දුබලතා විශ්‍රාම වැටුප් හිමි විශ්‍රාමික පුද්ගලයින් නිවැරදි කාල සීමාව තුලදී වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමක් වන අතර ඒ පිළිබඳව වාර්තා නිවැරදිව තබා ගැනීම කල යුතුය.

II. 2010.10.26 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2010හි දක්වා ඇති පරිදි දුබලතාවය ස්ථිර නොවන අවස්ථාවන්හිදී අදාල කාලසීමාව අවසාන වීමට ප්‍රථම (අවම වශයෙන් මසකට පෙර) නැවත වෛද්‍ය මණ්ඩලය වෙත විශ්‍රාමික නිලධරයා යොමු කල යුතුවේ.

III. පෙර වෛද්‍ය මණ්ඩල වාර්තාව අනුව දුබලතා විශ්‍රාම වැටුප් හිමි ගන්වන විට පැවති දුබලතාවය නැවත වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලබන අවස්ථාවේදී, වෙනස් නොවී පවතින බව වෛද්‍ය වාර්තාවෙන් තහවුරු වූ විට විශ්‍රාමික නිලධාරියා වෙත හිමි දුබලතා විශ්‍රාම වැටුප අඛණ්ඩව ගෙවිය යුතුය. යම් හෙයකින් වෛද්‍ය මණ්ඩල වාර්තාව ප්‍රමාද වන අවස්ථාවකදී දුබලතා විශ්‍රාම වැටුප අත්හිටුවා ඇත්නම්, අත්හිටවූ දින සිට හිමි විය යුතු හිඟ වැටුප් සමඟ ගෙවීම් සිදු කල යුතුය.

IV. පෙර වෛද්‍ය මණ්ඩල වාර්තාව අනුව දුබලතා විශ්‍රාම වැටුප් හිමිගන්වන විට පැවති දුබලතා ප්‍රතිශතය නැවත වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අවස්ථාවේදී, වර්ධනය වී පවතින විට වෛද්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් දිනය දක්වා පැවති දුබලතා ප්‍රතිශතය පදනම් කර ගනිමින්, අත්හිටුවා ඇති දුබලතා විශ්‍රාම වැටුප ගෙවීම් කල යුතුය. වෛද්‍ය මණ්ඩල වාර්තාව ප්‍රමාද වන අවස්ථාවකදී, නව දුබලතා ප්‍රතිශතය ලබා දුන් දිනයට නව සංශෝධිත දුබලතා ප්‍රතිශතය මත විශ්‍රාම වැටුප් සංශෝධිත දුබලතා ප්‍රදාන පත්‍රය නිකුත් කර එකී ගෙවීම් සිදු කල යුතුය.

V. පෙර වෛද්‍ය මණ්ඩල වාර්තාව අනුව දුබලතා විශ්‍රාම වැටුප හිමිගන්වන විට පැවති දුබලතාවය නැවත වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අවස්ථාවේදී, හීන වී ඇති විට වෛද්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් දිනය දක්වා පැවති දුබලතාවය පදනම් කර ගනිමින් දුබලතා විශ්‍රාම වැටුප ගෙවීම් කල යුතුය. වෛද්‍ය මණ්ඩල වාර්තාව මගින් නව දුබලතා ප්‍රතිශතය ලබා දුන් දිනයට සංශෝධිත දුබලතා ප්‍රතිශතය මත විශ්‍රාම වැටුප් සංශෝධිත දුබලතා ප්‍රදාන පත්‍රය නිකුත් කර ඒ අනුව ගෙවීම් සිදු කල යුතුය.

**ඒ.ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්